**ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

***

# පුවත්පත් නිවේදනය

## <u>විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය</u>

2023 ඔක්තෝබර් 11වන දිනකොළඹදී පැවති ඉන්දියානු සාගර කලාපීය වටද්දර රටවල සංගමයේ (IORA) 23 වන අමාත්‍ය කවුන්සිල රැස්වීම සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ 25 වැනි කමිටුව සඳහා ඉන්දියාව සහභාගී විය. ඉන්දීය දූත පිරිස මෙහෙයවනු ලැබුවේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතාවිසිනි.

2. මෙම හමුවේදී ඉන්දියාව2023-25 සඳහා IORA හි උපසභාපති භූමිකාවද අනතුරුව2025-27 සඳහා සභාපතිත්වයද භාරගත්තේය. මෙම හමුවට පෙරාතුවIORAජ්‍යෙෂ්ඨ නිලධාරීහු2022-27 සඳහා IORA හි වත්මන් සහ අනාගත කර්තව්‍යයන් සහ ක්‍රියාකාරකම්වල පූර්ණ පරාසය සමාලෝචනය කළහ. අමාත්‍ය කවුන්සිලයවිසින් කොළඹ ප්‍රකාශය සහ “ඉන්දියානු සාගර කලාපීය වටද්දර රටවල සංගමයේ දැක්ම 2023 සහ ඉන් ඔබ්බට” ඇතුළු අනෙකුත් IORA සම්බන්ධ ලේඛන සම්මත කරන ලදී.

3. විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් 2023 වසරේදී සිදු කරන ලද දෙවන ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී එතුමා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා හමු වී දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතාවලට අදාළවවිවිධ ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව සාකච්ඡා කළේය. 2023 ජූලි මස ශ්‍රී ලංකා ජනපතිගේ ඉන්දීය සංචාරය අතරතුර නිකුත් කරන ලද ද්විපාර්ශ්වික ආර්ථික හවුල්කාරිත්වදැක්ම සිහිපත් කරමින් එම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි වෙළඳ, ජනතාව අතර සබඳතා, බලශක්ති හවුල්කාරිත්වය යනාදි සම්බන්ධකතාවයේ විවිධ පැතිකඩ ශක්තිමත් කිරීම අවශ්‍ය බවට නායකයන් දෙපළ එකඟ වූහ. ආර්ථික හවුල්කාරිත්ව දැක්මෙහි අපේක්ෂිත ඉලක්ක කාලානුරූපීව සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමුඛතා පියවර වේගවත් කිරීමට ද ඔවුහු එකඟ වූහ.

4. මෙම සංචාරය ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතා හවුල්කාරිත්වයේ පුළුල් විෂය පථය සහ ශීඝ්‍රතාව පෙරට ගෙන ආවේය. ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රදේශයන්හි නිවාස 10000ක් ඉදිකිරීම සඳහා ක්‍රියාත්මකඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර යටතේ එක් නිවසක පිරිවැයශ්‍රී ලංකා රුපියල් මිලියන 1.026 සිට රුපියල් මිලියන 2.8 දක්වා තුන් ගුණයකටම පමණ ආසන්න අගයකින් ඉහළ නැංවීම සඳහා රාජතාන්ත්‍රික ලිපි හුවමාරු කර ගන්නා ලදී. මෙම නිවාසවලින් 1300ක් ඉදිකිරීම ඉතා ඉක්මනින් ආරම්භ කෙරෙනු ඇත. 50%ක් දක්වා අතිරේක අරමුදල් යොදවමින්දැනට ක්‍රියාත්මක ප්‍රදාන ව්‍යාපෘති 9ක් තවදුරටත් විධිමත් කිරීමට ඉන්දීය රජය ගත් තීරණයද රාජ්‍ය තාන්ත්‍රික ලිපි හුවමාරුව හරහා බලාත්මක විය.

5. ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර යටතේ බදුල්ල, මාතලේ සහ මාතර දිස්ත්‍රික්කවල නිවාස 126ක් මාර්ගගත ක්‍රමය ඔස්සේ විවෘත කෙරිණ. හම්බන්තොට, යාපනය, මාතලේ සහ පුත්තලම දිස්ත්‍රික්කවල ආදර්ශ ගම්මාන නිවාස සහ ග්‍රාම ශක්ති ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද නිවාස සියයකට අධික ප්‍රමාණයක්ද මාර්ගගත ක්‍රමය ඔස්සේ ජනතා අයිතියට පත් කරන ලදී.

6. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර රාජතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කර වසර 75ක් සපිරීම සනිටුහන් කරමින්විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපතිතුමාවිසින් විශේෂ සමරු ලාංඡනයක් එළිදක්වන ලදී. ජාතික ධජ දෙකෙහි වර්ණයන්ගෙන් සැදුම්ලත් සමරු ලාංඡනය මගින් ජාතික ලාංඡනද නිරූපණය වන අතර,එමගින් දෙරට අතර පවතින හවුල්කාරිත්වය, මිත්‍රත්වය සහ සමීප සබඳතා සංකේතවත් කෙරේ.

7. ලබාගත් තවත් විශේෂ ජයග්‍රහණයක් වන්නේ ජාතික කිරි සංවර්ධන මණ්ඩලය, ඉන්දියාවේ ගුජරාට් සමුපකාර කිරි අලෙවි සම්මේලනය (අමුල් ව්‍යාපාරය)සහ ශ්‍රී ලංකාවේ කාගිල්ස් සමූහ ව්‍යාපාරයඅතර කිරි නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ හවුල් ව්‍යාපාර කොටස් හිමියන්ගේ ගිවිසුමයි. මෙම ගිවිසුම ඉන්දියාවේ අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලංකාව කිරෙන් ස්වයංපෝෂිත කිරීම සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ඉන්දීය සංචාරය අතරතුර අත්සන් කරන ලද ඒකාබද්ධ අභිප්‍රාය ප්‍රකාශය ක්‍රියාවට නැංවීමකි.

***

කොළඹ
2023 ඔක්තෝබර් 13